# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/7 - 2018 ඔක්තෝබර් මස 30 වැනි අඟහරුවාදා - 2018.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) හා 56(2) වන ව්‍යවස්ථා ප්‍රකාරව කමිටු පත් කිරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සෞඛ්‍ය සේවා අංශය සඳහා සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුක්ත කමිටුවට දෙදහස් දහඅටේ (2018) නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි නැවත නියමයක් කරන තෙක් පහත නම් සඳහන් සාමාජිකයින් පත්කරනු ලැබේ.

I. රංජිත් මලිගස්පේ මහතා (සභාපති)
II. ඩබ්ලිව්. සුධර්මා කරුණාරත්න මහත්මිය (සාමාජික)
III. සින්නතම්බි ෂන්මුගම් මහතා (සාමාජික)

02. ඒ අනුව අංක 1990/25 හා 2016 ඔක්තෝබර් මස 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ගැසට් නිවේදනයේ අනු අංක 03 යටතේ සඳහන් කරුණු දෙදහස් දහඅටේ (2018) නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
නො. 1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 568


1A - G 28817 — 08 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*